**තඹලගමුව ප්‍රාදේශීය සභාව -2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

තඹලගමුව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට තඹලගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීම , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා  වන  බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ  ප්‍රාදේශීය සභාවේ  කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් ස්ථාවර වත්කම් 14ක එකතුව රු. 829,240ක් ගිණුම්වල ඇතුළත් කර නොතිබුණි. | අයිතම 14න් වර්ෂයකට අධික ආයු කාලයක් සහිත වත්කම් ස්ථාවර වත්කම් ලෙස අනාවරණය කෙරේ. | ස්ථාවර වත්කම් ගිණුම්ගත කළයුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ කාබනික පොහොර ව්‍යාපෘතියට රු. මිලියන 1ක් වැය වූ බව ගිණුම්වල දක්වා තිබුණත්, රු.498,443ක කාර්යයන් ඉටුකර නොතිබුණි. | කාබනික පොහොර නිෂ්පාදනය සඳහා රු.286,406ක භාණ්ඩ මිලදී ගෙන කාර්යාලයේ තබා ඇති අතර රු.498,443ක වටිනාකමට වර්තමානයේ ආරක්ෂිත වැට ඉදිකරමින් පවතින බැවින් මෙම කාර්යය ඉටු වූ වහාම අදාල අරමුණු ළඟාකර ගනු ලැබේ. | වියදම් සිදුවන අවස්ථාවේදි ඒ සඳහා උචිත ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම්

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර තිබූ මස්කඩ බදුකුලී සහ බලපත්‍ර ගාස්තු ආදායම් වටිනාකම සහ අදාල ලේඛන අතර රු.1,094,752ක වෙනස්කම් පැවැතුණි. | 2021 වර්ෂයේ මස්කඩය ලැබී තිබූ නමුත්, පවත්වාගෙන යාමට ඉදිරිපත් නොවූ අයගේ ලංසු ඇපකරය ඔවුන්ට ආපසු නොදී ඒවා සභාවේ ආදායම් ලෙස මාරුකිරීමේදි එය මස්කඩ බදුමුදල් ලෙස දක්වා ඇත. ඇතැම් ගව සතකාගාර ගාස්තුත් දෝෂයකින් මස්කඩ බදුකුලී ආදායම් ලෙස දක්වා ඇත. මේ නිසා මෙවැනි හේතු නිසා ලේඛන හා මූල්‍ය ප්‍රකාශන අතර වෙනස්කම් නිරූපනය විය. | ලේඛණ ගත ගිණුම් නිවැරදි කර ශේෂ ගැලපිය යුතුය. |

**1.7** **අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| මුදල් රෙගුලාසි **571** | 998,340 | තැන්පත් කර වර්ෂ දෙකක කාලයක් ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වර්ෂ දෙකක් ඉක්ම වූ සියළුම තැන්පතු ගෙවා නිරවුල් කිරීමට හෝ නැතහොත් රජයේ ආදායමට මාරුකිරීමට පියවර ගනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සුදුසු පියවර ගත යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,461,631ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,165,297 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) ප්‍රකාරව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි නිශ්චල දේපළ හඳුනාගෙන එහි වාර්ෂික වටිනාකම තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | බලප්‍රදේශයේ පිහිටි නිශ්චල දේපළ මත වරිපනම් බදු අයකිරීමට ප්‍රාථමික මට්ටමේ ක්‍රියාමාර්ග ගෙන ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව අදාල පියවර ගත යුතුය. |
| (ආ) | කුලී | | |
| i) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 (ඊ) ප්‍රකාරව 2020 වර්ෂයට | සතිපොල කුලී රු. 184,300ක් අයකළ නමුත් 2020 වර්ෂයේ | පනතේ ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අදාලව අයකළ යුතු සතිපොල කුලී රු. 121,200ක් අයකිරීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | හිඟහිටි රු.121,200ක් අයකළ නොහැකි විය. මේ පිළිබඳව වැඩිදුර ක්‍රියාමාර්ග ගනු ලැබේ. | |
| ii) | 2021 දෙසැම්බර් 31 දින දක්වා මස්කඩ බදුකුලී වශයෙන් ලැබිය යුතු රු. 3,552,966ක් වර්ෂ 01 සිට 04ක් දක්වා කාලයක් අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | ඉහත හිඟහිටි මුදල් අයකිරීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | හිඟහිටි අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

(ඇ) **බලපත්‍ර ගාස්තු**

| | | |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා පනතේ 159 ප්‍රකාරව 2020 වර්ෂයට නියමිත වෙළෙඳ බලපත්‍ර ගාස්තු රු. 150,600ක් සභාව විසින් අයකර නොතිබුණි. | ඇතැම් ව්‍යාපාරික ස්ථාන වසා දැමීම හේතුවෙන් වෙළෙඳ බලපත්‍ර ගාස්තු අයකළ නොහැකි විය. මේ පිළිබඳව වැඩිදුර ක්‍රියාමාර්ග ගනු ලැබේ. | හිඟහිටි අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේශීය ණය සංවර්ධන අරමුදලෙන් 2012 වර්ෂයේදී කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ලබාගත් ණය රු11,800,224. ක් සහ 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණයපොලී රු.2,483,385ක් මේ දක්වා ගෙවා නිරවුල් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය සහ පොලිය ගෙවීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇත. | දේශීය ණය සංවර්ධන අරමුදල සමඟ සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල මුළු වටිනාකම රු.93,571,416ක් වුවත් ඒ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණු අතර ඉඩම්වලට හිමිකම් ඔප්පු ලබාගැනීමටද පියවර ගෙන නොතිබුණි. | ස්ථාවර වත්කම්වල විස්තර ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කිරීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | නියමිත ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියට රු. මිලියනයක් වැයකර තිබූ අතර කල්මැටියාව - 95 උතුර ප්‍රදේශයේ අක්කර 03ක ඉඩම් සභාවට පවරාගෙන නොතිබුණි. | කාබනික පොහොර නිෂ්පාදනය සඳහා රු.286,406ක ද්‍රව්‍ය මිලදී ගෙන කාර්යාලයේ තබා ඇති අතර රු.498,443ක | හිමිකාරිත්වය පවරා ගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වට්නාකමට වර්තමානයේ ආරක්ෂිත වැට ඉදිකරමින් පවතින බැවින් මෙම කාර්යය ඉටු වූ වහාම අදාල අරමුණු ළඟාකර ගනු ලැබේ. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් කඩකාමර වසා දැමූ කාලයට බදුකරුවන්ට ලබාදුන් එකතුව රු.3,506,456ක වට්ටම් අදාල බලධාරීන්ගේ පූර්ව අනුමැතියකින් තොරව මූල්‍ය ප්‍රකාශනවලින් අඩුකර දක්වා තිබුණි. | වට්ටම් සම්බන්ධයෙන් අනුමැතිය ලබාගැනීමට පියවර ගෙන ඇත. | නියමිත ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | සමාලොචිත වර්ෂයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාර්ග 37ක් කොන්ක්‍රීට් කිරීමේ වියදම ගිණුම්ගත කර නොතිබුණි. | ඔබ විසින් අනාවරණය කරදුන් දෝෂ පිළිගෙන 2022 වර්ෂ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ලැබේ. | නියමිත ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ රු.64,800ක මැනුම් ගාස්තු ගෙවා තිබුණත්, පුස්තකාලය, කල්මැටියාව පොදු ළිඳ සහ කොම්පෝස්ට් වැඩපලට අදාල ඉඩම්වල මිනින්දෝරු සැලසුම් ලබාගෙන නොතිබුණි. | අදාල ඉඩම්වල මිනුම් කටයුතු සිදුකර ඇත. ඒවාට අදාල ඉඩම් ප්ලෑන මිනුම් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර නොතිබුණි. | මිනින්දෝරු සැලසුම් ලබාගැනීමට පියවර ගත යුතුය. |
| (උ) | පළාත් සභා සහ පළාත්පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ අංක PL/15/පොනි දරන 2021 ජූනි 18 දිනැති ලිපියට අනුව කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 1 ක් ලබාදී තිබුණද කාබනික පොහොර නිෂ්පාදනය කර විකිණීම මේ දක්වා සිදුකර නොතිබුණි. | අරමුදල් හිඟයක් පවතී. එසේම, කාබනික අපද්‍රව්‍ය LDSP වැඩසටහන යටතේ COMPOSE MAKING යන්ත්‍රය මිලදී ගෙන ඇත. | නියමිත ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක්ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනැවිය යුතු වුවත්, 2021 දෙසැම්බර් 31 දින දක්වා කාරණා 05ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. මේ හේතුවෙන් ඉතිරි අතුරු ව්‍යවස්ථා 25ම අනුමත කර නොතිබූ හෙයින් එමගින් ලැබෙන ආදායම් අයකළ නොහැකිව පැවැතුණි. | පළමු අදියර වශයෙන් කාරණා 5ක් ඉටුකිරීමට අතුරු ව්‍යවස්ථා පනවා තිබූ නමුත් අනෙකුත් කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කර එහි ක්‍රියාවලීන් අනුගමනය කර ගැසට් පත්‍රයේ පලකරනු ලැබේ. | අතුරු ව්‍යවස්ථා පනවා අදාළ නියාමන කටයුතු සිදු කළයුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) නඩත්තුව සහ අළුත්වැඩියා සිදුනොකිරීම** | | |
| සභාව සතු යතුරු පැදියක්, රෝද දෙකේ ට්‍රැක්ටර 02ක් අළුත්වැඩියා කර භාවිතා කිරීමට පියවර නොගෙන වර්ෂ 04 සිට 13ක් දක්වා කාලයක් නිෂ්කාර්යව පැවැතුණි. | අළුත්වැඩියා කිරීමට පියවර ගනු ලැබේ. | වාහන අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් සුදුසු පියවර ගත යුතුය. |
| **(ආ) වත්කම්වලින් ලබාගත යුතු ආදායම් ලබානොගැනීම** | | |
| තම්බලගමුව ප්‍රාදේශීය සභාවේ පොදු වෙළෙඳපොල ගොඩනැගිල්ල රු.5,978,814ක පිරිවැයකින් ඉදිකර තිබූ නමුත්, එම ගොඩනැගිල්ල කුලියට දී ආදායම් ඉපැයීමට පියවර ගෙන නොතිබුණි. | අප සභාවට අයත් එම පොදු වෙළෙඳපොල ගොඩනැගිල්ල කුලියට හෝ බදු පදනමින් ලබාදීමට විධිවිධාන සලසා ඇත. | ගොඩනැගිල්ල භාවිතා කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(ඇ) වාර්ෂික භාණ්ඩ/තොග සමීක්ෂණය** | | |
| 2020 වර්ෂයට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය, 2021 වර්ෂය අවසාන වී තිබූ නමුත් තොග සමීක්ෂණ මණ්ඩලය 2022 මැයි 31 දින වන විටත් සමීක්ෂණ මණ්ඩල නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2021 වර්ෂයේ තොග සමීක්ෂණ මණ්ඩලයේ වාර්තා පදනම් කරමින් වර්තමානයේ ඉදිරි කටයුතු සිදුකෙරේ. | තොග සමීක්ෂණ මණ්ඩලයේ වාර්තා පදනම් කරමින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ක්‍රිඩා පිටිය ප්‍රතිසංස්කරණය - රු.1,500,000ක් | | |
| ග්‍රාමීය සහ පාසැල් ක්‍රීඩා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ කල්මැටියාව දකුණ, යුනයිටඩ් ක්‍රිඩා සමාජ පිට්ටනිය ප්‍රතිසංස්කරණය සඳහා රු.1,500,000ක් ප්‍රතිපාදන සලසා තබුණි. ඉන්, එකතුව රු.479,908ක කාර්යයන් ඉටුකර තිබූ බවට විගණනයේදි සනාථ කළ නොහැකි විය. කෙසේ වෙතත්, ඉහත කාර්යය රු.1,218,730කට අවසන් කර තිබූ අතර විගණනය දිනය වන වර්තමානය වන විටත්, අදාල අරමුණු සඳහා පූර්ණ වශයෙන් භාවිතයට ගෙන නොතිබුණි. | කල්මෙට්ටියාව දකුණ, යුනයිටඩ් ක්‍රිඩා සමාජ පිට්ටනිය ප්‍රතිසංස්කරණය කර අදාල ක්‍රීඩා සමාජයටම ආපසු භාරදී ඇත. | ක්‍රීඩා පිටිය භාවිතා කිරීමට උචිත ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 2.1 ඡේදයට අනුව ප්‍රාදේශීය සභා සභාපති සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයින් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් ලබානොදී සමාජ මට්ටමේ ආයතනවලට නිර්දේශ මත එකතුව රු. 82,991,952ක කොන්ත්‍රාත් පිරිනමා තිබූ බව නිරීක්ෂණය විය. | 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රජා මධ්‍යස්ථානවල කොන්ත්‍රාත් කාර්යයන් පිරිනැමීමට ප්‍රථම සංවිධානවල ක්‍රියාකාරිත්වය සහ පැවැත්ම ආදිය දැනුවත්වීම සඳහා අයදුම්පත්‍ර නිකුත් කර CDOහි නිර්දේශ ලබා, පසුව ප්‍රජා මධ්‍යස්ථානවලට කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු සහ අතිරික්තයන්** | | |
| | ප්‍රාථමික මට්ටමේ තනතුරු 2ක පුරප්පාඩුත්, සේවකයින් 07කගේ අතිරික්තත් පැවැතුණු අතර ද්විතියික මට්ටමේ තනතුරු 03ක පුරප්පාඩු සහ අතිරික්ත 04ක් පැවැතුණි. | ද්විතියික මට්ටමේ කළමනාකරණ සේවා නිලධාරී, ආදායම් පරීක්ෂක සහ අධීක්ෂක එක් අයෙකු බැගින් ද, තෘතීයික මට්ටමේ රියැදුරෙකුගේ පුරප්පාඩුවක් ද පිරවීමට පියවර ගෙන ඇත. | හිඟව පවතින පුරප්පාඩු පිරවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික අයවැය ප්‍රකාරව සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කාර්යයන් සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි | 2022 වර්ෂයට අනුව වූ අයවැය ප්‍රකාරව සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කාර්යයන් සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කරනු ලැබේ. | ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභා සහ පළාත්පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ චක්‍රලේඛය පරිදි සභාවේ අභ්‍යන්තර විගණකවරයා විසින් අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර නොතිබුණි. | වර්තමානයේ අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර මෙම කාර්යයන් සාර්ථක ලෙස සිදුකරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක DMA/01-2019හි 5.3 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් පැවැත්විය යුතු බව සඳහන් වුවත්, සභාව විසින් කමිටු රැස්වීම් දෙකක් පමණක් සමාලෝචිත වර්ෂයේ පවත්වා තිබුණි. | ඉදිරි වර්ෂවල චක්‍රලේඛය ප්‍රකාරව කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව උචිත ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4.4 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් එහි බලප්‍රදේශය තුළ රැස්කරනු ලබන කසල කැලෑ පෙදෙසේ වර්ගීකරණය නොකර බැහැර කරනු ලබන අතර සභාව විසින් නියමිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි. | මෙම ඉඩම සභාවට මුදාහරින ලෙසට තම්බලගමුව ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් කරනු ලැබූ ඉල්ලීම පරිදි ප්‍රදේශයේ ඉඩම භාරදීමෙන් පසුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය නිසිපරිදි සිදුකරනු ලැබේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව උචිත ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4.5 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන අරමුණු පනත ප්‍රකාරව 2030 වර්ෂයේ ළඟාකර ගතයුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සභාව විසින් පිළියෙල කර ඒ සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය සභාව විසින් පිළියෙල කර ඒ පිළිබඳ ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව උචිත ක්‍රියාමාර්ග ගත යුතුය. |